මගේ අංකය : DL/E/21/LO /EB/2020

ආයතන අංශය

කම්කරු දෙපාර්තමේන්තුව

කොළඹ 05

2020.06. 18

**සියළුම කම්කරු කොමසාරිස්වරුන්/නියෝජ්‍ය කම්කරු කොමසාරිස්වරුන්/ සහකාර කම්කරු කොමසාරිස්වරුන්/ දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවරුන්/ජ්‍යෙෂ්ඨ කම්කරු නිලධාරීන්,**

**<u>කම්කරු නිලධාරීන් සඳහා II වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය</u>**

කම්කරු දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍රගත කාර්යාලගත බණ්ඩ 2 සේවා ගණය සඳහා 2013.09.26 දිනෙන් අනුමත බඳවා ගැනීමේ පරිපාටිය අනුව කම්කරු නිලධාරී තනතුරේ I වන ශ්‍රේණියට උසස් වී වසර 5 ක් ගතවීමට පෙර සමත් විය යුතු II වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සඳහා 2018.12.04 දිනැති PSC/APP/4/65/2018(I) අංක දරන රාජ්‍ය සේවා කොමිෂන් සභා ලිපිය අනුව, කම්කරු නිලධාරී I වන සහ II වන ශ්‍රේණිවල නිලධාරීන්ට ඉදිරිපත් වීමට හැකියාව පවතින බව දන්වා ඇත.

02. ඒ අනුව කම්කරු නිලධාරීන් සඳහා II වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය **<u>2020 අගෝස්තු මාසයේ දී</u>** ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය මගින් පැවැත්වීමට සැලසුම් කර ඇත.

03. මේ සම්බන්ධයෙන් නිකුත් කර ඇති අයදුම්පත් කැඳවීමේ නිවේදනය හා ආදර්ශ අයදුම්පත්‍රයේ පිටපතක් මේ සමඟ අමුණා එවමි.

04. මෙම පරීක්ෂණයට පළමුවරට ඉල්ලුම් කරන අපේක්ෂකයින් ගෙන් හැර අනෙකුත් සියළුම අපේක්ෂකයින්ගෙන් පහත සඳහන් පරිදි විභාග ගාස්තු අය කරනු ලැබේ.

- එක් විෂයයක් සඳහා රු:300/=

05. විභාග ගාස්තු ගෙවීම

විභාග ගාස්තු, අයදුම්පත් භාරගන්නා අවසාන දිනයට පෙර ඔබගේ කාර්යාලයේ හෝ ප්‍රධාන කාර්යාලයේ සරප් අංශයට මුදල් ගෙවා ලබාගත් ලදුපත ඉල්ලුම් පත්‍රයේ අදාළ ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතුය.

06. ඔබ අංශයේ/ කලාපයේ සියලුම කම්කරු නිලධාරීන්ට මේ සම්බන්ධයෙන් දැනුවත් කරන ලෙස දන්වමි. ඉදිරිපත් කරන අයදුම්පත් හි අංක 08 යටතේ ඉල්ලුම්කරු ගේ ආසන්නතම අධීක්ෂණ නිලධාරියාගේ නිර්දේශය සහිතව **<u>2020.07.03</u>** දින හෝ ඊට පෙර මා වෙත ඉදිරිපත් කරන මෙන් කාරුණිකව දන්වමි.

එච්.ටී.පී.අබයරත්න
වැ.බ. නියෝජ්‍ය කම්කරු කොමසාරිස් (පාලන)
කම්කරු දෙපාර්තමේන්තුව
කොළඹ 05.

එච්.ටී.පී අබයරත්න
නියෝජ්‍ය කම්කරු කොමසාරිස් (පාලන)

අත්/කලේ: ඒ. විමලවීර
කම්කරු කොමසාරිස් ජනරාල්

පිටපත්: 01. ලේකම්, කම්කරු, වෘත්තීය සමිති සබඳතා සහ සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යාංශය
02. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය
03. ප්‍රධාන ගණකාධිකාරී
04. ලේකම්, රාජ්‍ය සේවා කම්කරු නිලධාරී සංගමය - ඔබ සංගමයේ නිලධාරීන් දැනුවත් කිරීම සඳහා

## කම්කරු දෙපාර්තමේන්තුව

## කම්කරු නිලධාරීන් II වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය 2020

කම්කරු නිලධාරීන් සඳහා II වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය කම්කරු කොමසාරිස් ජනරාල් විසින් 2020 අගෝස්තු මාසයේ දී ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය මගින් පැවැත්වීමට සැලසුම් කර ඇත.

1. විභාග පරිපාටිය

1.1. **II වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය ( I ශ්‍රේණියේ සහ II ශ්‍රේණියේ නිලධාරීන් සඳහා)**

1.1.1. විභාගය පිළිබඳ විස්තරය :

| ප්‍රශ්න පත්‍රය | කාලය | උපරිම ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| කම්කරු නීති | පැය 03 | 100 | 40 |

1.1.2. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| විෂයය | විෂය නිර්දේශය | කාලය |
|---|---|---|
| කම්කරු නීති | අධිකරණමය ක්‍රියාවලිය සහ කම්කරු නීති යටතේ පරීක්ෂණ පැවැත්වීම පිළිබඳ ප්‍රායෝගික දැනුම පරීක්ෂා කිරීම | පැය 03 |

**02. අයදුම්පත් ඉදිරිපත් කිරීම :**

මෙම පරීක්ෂණයට පෙනී සිටීමට බලාපොරොත්තු වන අපේක්ෂයින් මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුකූලව A4 කඩදාසියක දෙපැත්තම පාවිච්චි කරමින් අංක 01 සිට 05 දක්වා ඡේද එක් පිටුවකටත්, ඉතිරි කොටස අනෙක් පිටුවටත් වන සේ සකසා ගත් අයදුම්පත් අධීක්ෂණ නිලධාරියාගේ නිර්දේශය සහිතව **<u>2020.07.03 දින හෝ ඊට පූර්ව කම්කරු කොමසාරිස් ජනරාල්</u>** වෙත ලැබෙන සේ එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස උඩ කෙළවරේ **<u>"කම්කරු නිලධාරී තනතුර සඳහා II වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය "</u>** යනුවෙන් සඳහන් කළ යුතුය. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**03. විභාග ගාස්තු :**

මෙම පරීක්ෂණයට පළමුවරට ඉල්ලුම් කරන අපේක්ෂකයින්ගෙන් හැර අනෙකුත් සියලුම අපේක්ෂකයින් ගෙන් පහත සඳහන් පරිදි විභාග ගාස්තු අය කරනු ලැබේ.

- එක් විෂයයක් සඳහා රුපියල් 300/=

**04. විභාග ගාස්තු ගෙවීම :**

විභාග ගාස්තු, අයදුම්පත් භාරගන්නා අවසාන දිනයට පෙර ඔබගේ කාර්යාලයේ හෝ ප්‍රධාන කාර්යාලයේ සරප් අංශයට මුදල් ගෙවා ලබාගත් ලදුපත ඉල්ලුම් පත්‍රයේ අදාළ ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. (මෙම ලදුපතේ ඡායා පිටපතක් අපේක්ෂකයා ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

**05. විභාගයට පෙනී සිටීමට සුදුසුකම් :**

මෙම නිවේදනය සැලකිල්ලෙන් කියවා ඉල්ලා ඇති සියලුම තොරතුරු සම්පූර්ණ කර, අයදුම්පත් නියමිත දිනට හෝ ඊට පෙර ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. මෙම නිවේදනයේ අවශ්‍යතාවයන්ට අනුකූල නොවන අයදුම්පත් වේකොත් ඒවා ප්‍රතික්ෂේප කිරීමට සිදුවනු ඇත.

**06. විභාගයට ඇතුළත් කර ගැනීම හා ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීම :**

අයදුම්පත් ඉදිරිපත් කර ඇති සුදුසුකම් සපුරා තිබෙන සියලුම අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර හා කාලසටහන් ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය විසින් නිකුත් කරනු ලැබේ.

07. විභාගයට පෙනී සිටීම සඳහා පැමිණීම වෙනුවෙන් ගමන් වියදම්, සංයුක්ත දීමනා හෝ උපවේශන දීමනා කිසිවක් ගෙවනු නොලැබේ.

එච්.ටී.පී.අබයරත්න
වැ.බ. නියෝජ්‍ය කම්කරු කොමසාරිස් (පාලන)
කම්කරු දෙපාර්තමේන්තුව
කොළඹ 05.

එච්.ටී.පී අබයරත්න
නියෝජ්‍ය කම්කරු කොමසාරිස් (පාලන)

අත්/කලේ: ඒ. විමලවීර
කම්කරු කොමසාරිස් ජනරාල්

දිනය: 2020.06.18

ආදර්ශ අයදුම්පත්‍රය

| |
|---|
| |

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

**කම්කරු දෙපාර්තමේන්තුව**

**කම්කරු නිලධාරීන් සඳහා පැවැත්වෙන II වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය 2020**

01. 1.1 අයදුම්කරුගේ මුලකුරු සමග නම : (සිංහලෙන්) ..........................................................................

..........................................................................

1.2 අයදුම්කරුගේ මුලකුරු සමග නම : (ඉංග්‍රීසියෙන්) ..........................................................................

..........................................................................

1.3 සම්පූර්ණ නම : (සිංහලෙන්) ..........................................................................

..........................................................................

1.4 සම්පූර්ණ නම : (ඉංග්‍රීසියෙන්) ..........................................................................

..........................................................................

02. 2.1 තනතුර : ..........................................................................

03 3.1 ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය : (සිංහලෙන්) ..........................................................................

..........................................................................

3.2 ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය : (ඉංග්‍රීසියෙන්) ..........................................................................

..........................................................................

3.3 රාජකාරී ස්ථානය හා එහි ලිපිනය : ..........................................................................

..........................................................................

3.4 දුරකථන අංක : රාජකාරී : [ ] පුද්ගලික : [ ]

04. 4.1 ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

4.2 උපන් දිනය :

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

4.3 ස්ත්‍රී පුරුෂ භාවය : [ ]

05. 5.1 විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය : [ ]

5.2 පෙනී සිටීමට බලාපොරොත්තු වන විභාගය : [ ]

5.3 පෙනී සිටීමට බලාපොරොත්තු වන විෂයය/විෂයයන් :

| | |
|---|---|
| | |
| | |

06. 6.1 ඔබ මෙම පරීක්ෂණයට ඉල්ලුම් කරනුයේ පළමු වරට ද?

6.2 ඉහත 6.1 ට පිළිතුර "නැත" නම් නිවේදනය අනුව විභාග ගාස්තු ගෙවන ලද කාර්යාලයේ නම : ..............................................................................................................

6.3 මුදල් ගෙවන ලද කුවිතාන්සියේ අංකය හා දිනය : ..............................................................................................................

(මුදල් ගෙවන ලද කුවිතාන්සිය නොගැලවෙන සේ එක් කෙළවරකින් මෙහි අලවන්න. එහි ඡායා පිටපතක් ඔබ ලග තබා ගන්න.)

07. අයදුම්කරුගේ ප්‍රකාශය :

(අ) මෙම අයදුම්පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. .

(ආ) මෙම විභාගයට අදාළ සියලුම කොන්දේසි පිළිපැදීමට මම එකඟ වෙමි.

දිනය : අයදුම්කරුගේ අත්සන

08. කාර්යාල/අංශ ප්‍රධානියාගේ නිර්දේශය :

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන ඉහත අත්සන යෙදූ නිලධාරියා/ නිලධාරිනිය මෙම කාර්යාලයේ/ අංශයේ සේවය කරන බව සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

දිනය : කාර්යාල/අංශ ප්‍රධානියාගේ අත්සන
නිල මුද්‍රාව

09. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය

(i) ඉහත සපයා ඇති විස්තර පරීක්ෂා කර බැලූ බවත්, ඒවා නිවැරදි බවත්,

(ii) අපේක්ෂකයා/ අපේක්ෂිකාව මෙම විභාගයට පෙනී සිටීමට සුදුසු බවත් සහතික කරමි.

දිනය: දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන